පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA


තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. 517

ෆැක්ස් / தொலைநகல் / Fax No. 011- 2329500

දුරකථනය / தொலைபேசி / Telephone 011-2384024, 011-2395605

Website: www.police.lk

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail Policemedia@police.lk


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date

**2020.01.27 පැය 1300**

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**

**මහත්මයාණනි / මහත්මියණි**


# 72 වන ජාතික නිදහස් සමරු උළෙල වෙනුවෙන් කොළඹ ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ රථවාහන සැළැස්ම.

72 වන නිදහස් දින සැමරුම් උත්සවය මෙවරත් අභිමානවත් ලෙස 2020 පෙබරවාරි 04 දින නිදහස් චතුරශ්‍රයේදී පැවැත්වීමට නියමිතව ඇත. ඒ අනුව නිදහස් උත්සව දින හා පෙරහුරු පැවැත්වෙන දිනවල මාර්ග වසා තැබීම හා ගමනා ගමනය සීමා කිරීම සඳහා විශේෂ රථවාහන සැළැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

**අදාල රථවාහන සැළැස්මට අනුව එක් එක් දිනයන්හි මාර්ග වසා තබන / ගමනාගමනය සීමා කරන ස්ථාන සහ විකල්ප මාර්ග පහත පරිදි වේ.**

1. 2020.01.31 දින උදෑසන 08.30 සිට මධ්‍යහන 01.00 දක්වා.
2. 2020.02.01 දින උදෑසන 06.00 සිට මධ්‍යහන 12.00 දක්වා.
3. 2020.02.02 දින උදෑසන 06.00 සිට මධ්‍යහන 01.00 දක්වා.
4. 2020.02.03 දින උදෑසන 08.30 සිට මධ්‍යහන 01.00 දක්වා.
5. 2020.02.04 දින (නිදහස් සමරු උළෙල පැවැත්වෙන දින අළුයම 04.00 සිට මධ්‍යහන 01.00 දක්වා.

# මාර්ග වසා තැබීම / ගමනාගමනය සීමා කිරීම.



A ග්ලාස් හවුස් හංදියෙන් නන්දා මෝටර්ස් දෙසට ඇතුල් වීම.

B පුස්තකාල හංදියෙන් ග්ලාස් හවුස් දෙසට ඇතුල් වීම.

C පුස්තකාල හංදියෙන් ආනන්ද කුමාරස්වාමි මාවතට (ග්‍රීන්පාත්) ඇතුල් වීම.

D ධර්මපාල මාවතෙන් එෆ්.ආර්. සේනානායක මාවතට ඇතුල් වීම.

E සොයිසා වටරවුමෙන් කන්නංගර මාවතට ඇතුල් වීම.

F එෆ්.ආර්. සේනානායක මාවතෙන් කන්නංගර මාවතට ඇතුල් වීම.

G විජේරාම මාවතෙන් රොස්මිඩ් පෙදෙස ඔස්සේ කන්නංගර මාවත දෙසට ඇතුල් වීම.


H විජේරාම මාවතෙන් බාන්ස් පෙදෙස ඔස්සේ කන්නංගර මාවත දෙසට ඇතුල් වීම.

I හෝර්ටන් පෙදෙස විජේරාම හංදියෙන් හෝර්ටන් මේට්ලන්ඩ් ක්‍රසන්ට් හංදිය දෙසට ඇතුල් වීම.

J විජේරාම මාවත සිට ආර්.ජී. සේනානායක මාවත ඔස්සේ මේට්ලන්ඩ් ක්‍රසන්ට් දෙසට ඇතුල් වීම.

K හෝර්ටන් පෙදෙස මේට්ලන්ඩ් ක්‍රසන්ට් හංදියෙන් හෝර්ටන් වටරවුම දෙසට ඇතුල් වීම.

# මාර්ග වසා තැබීම / ගමනාගමනය සීමා කිරීම.



L ආර්.ජී. සේනානායක මාවතෙන් මේට්ලන්ඩ් ක්‍රසන්ට් වෙත ඇතුල් වීම.

M විජේරාම මාවත විද්‍යා මාවත හංදියෙන් විද්‍යා මාවතට ඇතුල් වීම.

N විද්‍යා මාවතෙන් මේට්ලන්ඩ් පෙදෙසට ඇතුල් වීම.

O බෞද්ධාලෝක මාවත සිට (ආර්.එෆ්.පී. හංදියෙන්) මේට්ලන්ඩ් පෙදෙසට ඇතුල් වීම.

P බෞද්ධාලෝක මාවත සිට (ටොරිංටන් හංදියෙන්) ප්‍රේමකීර්ති ද අල්විස් මාවතට ඇතුල් වීම.

Q ප්‍රේමකීර්ති ද අල්විස් මාවතෙන් නිදහස් මාවතට ඇතුල් වීම.


R ස්ටැන්ලි විජේසුන්දර මාවතෙන් පදනම පාරට ඇතුල් වීම.

S පදනම් ආයතනය අසලින් නිදහස් චතුරශ්‍රය දෙසට ඇතුල් වීම.

T පදනම පාරෙන් නිදහස් මාවතට ඇතුල් වීම.

U නිදහස් වටරවුමෙන් නිදහස් මාවතට, නන්දා මෝටර්ස් දෙසට සහ මේට්ලන්ඩ් ක්‍රසන්ට් දෙසට ඇතුල් වීම.

# රථවාහන විකල්ප මාර්ග වෙත යොමු කිරීම.
# (කොළඹට ඇතුල් වීම)




## ගමනාගමනය සීමා කර හෝ මාර්ග වසා ඇති ප්‍රදේශ මගහැර පහත පරිදි කොළඹට ඇතුල් විය හැකිය,

01. ගාලු පාර ඔස්සේ කොල්ලුපිටිය හංදිය දෙසින් පැමිණෙන රථවාහන ලිබර්ටි වටරවුම, ධර්මපාල මාවත, පිත්තල හංදිය (ධර්මපාල මාවත ජේම්ස් පීරිස් මාවත හංදිය), රතුකුරුස හංදිය, ලිප්ටන් වටරවුම ඔස්සේ යුනියන් පෙදෙසට, වෝඩ් පෙදෙසට සහ ඩීන්ස් පාරට ඇතුල් විය හැකිය.

02. හැව්ලොක් පාර තුම්මුල්ල දෙසින් පැමිණෙන රථවාහන තර්ස්ටන් පාර, මල් පාර (අර්නස්ට් ද සිල්වා මාවත) මල් පාර හංදිය, පිත්තල හංදිය ඔස්සේ ජේම්ස් පීරිස් මාවතට සහ ධර්මපාල මාවතට ඇතුල් විය හැකිය.

03. හෝර්ටන් පෙදෙස ඔස්සේ පැමිණෙන රථවාහන හෝර්ටන් පෙදෙස විජේරාම හංදියෙන් දකුණට හරවා වෝඩ් පෙදෙස, සොයිසා වටරවුම ඔස්සේ ධර්මපාල මාවතට, යුනියන් පෙදෙසට සහ ඩීන්ස් පාරට ඇතුල් විය හැකි අතර තුම්මුල්ල දෙසට ධාවනය කිරීම සඳහා බෞද්ධාලෝක මාවත (බුලර්ස් පාර) ද භාවිතා කල හැකිය.

# රථවාහන විකල්ප මාර්ග වෙත යොමු කිරීම.
# (කොළඹින් පිටවීම)



**ගමනාගමනය සීමා කර හෝ මාර්ග වසා ඇති ප්‍රදේශ මගහැර පහත පරිදි කොළඹින් පිට විය හැකිය,**

01. ධර්මපාල මාවත, යුනියන් පෙදෙස හෝ ඩීන්ස් පාර ඔස්සේ සොයිසා වටරවුමට පැමිණෙන රථවාහන වලට බොරැල්ල දෙසට ධාවනය සඳහා වෝඩ් පෙදෙස භාවිතා කල හැකිය.

02. වෝඩ් පෙදෙස විජේරාම හංදියෙන් විජේරාම මාවතට ඇතුල් වී හෝර්ටන් පෙදෙස ඔස්සේ ද බොරැල්ල දෙසට ධාවනය කල හැකිය.

03. බෞද්ධාලෝක මාවතට (බුලර්ස් පාරට) පිවිසෙන රථවාහන වලට කනත්ත වටරවුම දෙසින් පිටව යා හැකිය.

04. යුනියන් පෙදෙස, ඩීන්ස් පාර සහ වෝඩ් පෙදෙස ඔස්සේ සොයිසා වටරවුමට පැමිණ හැව්ලොක් පාර දෙසට පිටව යන රථවාහන ධර්මපාල මාවත, පුස්තකාල හංදිය, මල් පාර හංදිය, මල් පාර (අර්නස්ට් ද සිල්වා මාවත) ජේ.ඕ.සී. හංදිය, රාජකීය මාවත, රීඩ් මාවත (පිලිප් ගුණවර්ධන මාවත) තුම්මුල්ල වටරවුම ඔස්සේ පිටව යා හැකිය,

05. යුනියන් පෙදෙස, ඩීන්ස් පාර සහ වෝඩ් පෙදෙස ඔස්සේ සොයිසා වටරවුමට පැමිණ ධර්මපාල මාවත ඔස්සේ ගාලු පාර දෙසට පිටව යන රථවාහන පුස්තකාල හංදිය, මල් පාර හංදිය, ආනන්ද කුමාරස්වාමි මාවත, ලිබර්ටි වටරවුම, ඩුප්ලිකේෂන් පාර (ඊ.ඒ. ද මෙල් මාවත) ඔස්සේ පිටව යා හැකිය.

- ඉහත වසා තැබෙන ප්‍රදේශය තුල පදිංචිකරුවන් සඳහා (අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු) ඔවුන්ට ඇතුල් වීමට අවශ්‍ය මාර්ගයේ පෙලපාලි, සන්නද්ධ රථ හෝ විශේෂ ගමන් මාර්ග ක්‍රියාත්මක නොවන අවස්ථා වලදී ඇතුල් වීමට ඉඩ දෙනු ලැබේ.

- මාර්ග වැසීම හෝ ගමනාගමනය සීමා කරන ප්‍රදේශ හරහා ගමන් කිරීමට පැමිණෙන රථවාහන වල ගමන් ගන්නා රියදුරන් ඇතුළු මහජනතාවට අපහසුතාවයක් සිදු නොවන පරිදි ආසන්නතම හා පහසුම විකල්ප මාර්ග ඔස්සේ යොමු කරනු ලැබේ.

- කොළඹ නගරය හරහා ගමන් කරන රථවාහන වලට නිදහස් චතුරශ්‍ර ප්‍රදේශයට ආසන්නතම මාර්ග භාවිතා නොකර දුරස්ථව ඇති අනෙකුත් විකල්ප මාර්ග භාවිතයෙන් ගමනාගමන පහසුව සලසා ගත හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**පොලිස් මූලස්ථානය,**

**කොළඹ 01.**

# ස්තූතියි.